**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
sjturaus@optusnet.com.au

**Account Name** - **Sannasa Media**
Bank - Cmmonwealth
BSB - 063619
Ac - 10852409

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්4ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

**වැදගත්**

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දක්වීමට අවසර ඇත



# ජාතිකවාදී උන්මාදය

## තිසරණී ගුණසේකර

### ගිවිසුම මගින් සිංහලයන් අතරේ ජාතිකවාදී උන්මාදයක් ජනනය කෙළේය

***"වෙලාව ඇවිල්ලා" පූජණීය බෝ ගස යට පැවති උද්ඝෝෂණයේදී එක් තරුණ අන්තවාදී භික්ෂුවක් ප්‍රකාශ කෙළේය. "අපි අපේ ජීවිත පූජා කරන්න ලෑස්ති වෙන්න ඕනේ" - විලියම් මැක්ගොවන් (මිනිසාම ය තිරිසන් වන්නේ - ශ්‍රී ලංකාවේ බේදවාචකය)***

"මව්බිම අනතුරේ" යැයි නැවත වතාවක් කියනු ඇසේ. වචන සුපුරුදු ය. 1980 අවසාන භාගයෙන් ඒවා නින්නාද දෙයි. ඒ කාලයේ දකුණේ හැට දහසක් මියගියේ ලූ. සෑම දේශපාලනයකටම අයත් ගැහැනු පිරිමි ඒ අතරේ වූහ. එසේම කිසි දේශපාලනයකට නැති අයත් වූහ. සමහරුන්ට, ප්‍රශ්න ගැන යම් වැටහීමක් තිබුණි. තවත් සමහරුන්ට එවැනි වැටහීමක් නොතිබුණි. පළාත් සභාවලට එරෙහි එක් පෙළපාලියකදී "පළා බබා අපිට එපා" කියමින් කෑගැසූහ. "පළාත් සභා අපිට එපා" යැයි කියමින් කෑගැසීමට පුළුවන් කම තිබුණත්, "පළාත් සභා" යන්න එදා බොහෝ දෙනාට ගෝචර වූ දෙයක් නොවුණි. මේ සිද්ධියෙන් පෙන්නුම් කරන්නේ, කෙනෙකුට නොවැටහෙන දෙයකට, කෙනෙකු සම්බන්ධ වීමට අදහසක් නොකරන දෙයකට බලහත්කාරයෙන් ඇද ගනු ලැබූ අසරණ ජනතාවකගේ ශෝචනීය තත්වයයි. තුවක්කු දරා සිටි මිනිසුන්ගේ බහට අවනත නොවීම සිහි මොළේ ඇතිව කළ හැකි දෙයක් නොවුණි. විශේෂයෙන්, අනෙකා නොඉවසීම ඉහවහා ගිය, ඝාතනය තුට්ටුවකට මායිම් නොකළ වකවානුවක, කොහෙත්ම එය කළ හැකි දෙයක් නොවේ.

ඒ ලේ වැකි වකවානුවේ ජීවත් නොවූ කෙනෙකුට, එදා පළාත් සභා නැමැති ප්‍රපංචය විසින් ඇති කෙරුණු භීතිකාවේ සහ වෛරයේ තරම කෙතෙක්දැ යි සිතා ගත නොහැකි වනු ඇත. අද ඒ පළාත් සභා, පාර්ලිමේන්තුව යන වචනය තරමටම සාමාන්‍ය ව්‍යවහාරයක් බවට පත්ව තිබේ. වියදම්කාරී බව ඇත්ත. දූෂිත බව ඇත්ත. අකාර්යක්ෂම බවත් ඇත්ත. එහෙත් ඒවා භයානක යැයි අද කෙනෙකු නොකියනු ඇත. පළාත් සභා පිළිබඳ සංකල්පය, බෙදුම්වාදයේ සීඝ්‍ර මාවතකැ යි අද විශ්වාස කරන කෙනෙකු ඇතොත් ඒ කලාතුරකිනි. කෙසේ වෙතත්, ඒ වෙනුවෙන් අද කිසිවෙකු මිනිමරා ගන්ට යන්නේ නැත.

එහෙත් 1980 අවසාන කාලයේ පැවති තත්වය ඊට ඉඳුරා වෙනස් ය. එදා පළාත් සභා අර්ථ ගැන්වුණේ, මිහිමත ඇති රුදුරු නපුර වශයෙනි. වෙනත් නමකින් සහ වේශයකින් එන "ඊලාමයක්" වශයෙනි. "මව්බිම" වනසාලීම සඳහා ද්‍රෝහීන් සහ අධිරාජ්‍යවාදීන් ඇටවූ උගුලක් වශයෙනි. "ඉන්දු - ලංකා ගිවිසුමට" එරෙහිව, 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව සහ පළාත්බදව බලය විමධ්‍යගත කිරීමට එරෙහිව එදා පෙළ ගැසුණු දේශපාලනික නායකයන්, පළාත් සභා යනු ඊලාම් රාජ්‍යයක් යැයි ගැනීම නොම්මර එකේ බොරුවක් බව දැන සිටියාට සැක නැත. ඔවුන්ට එය දේශපාලනික පහුරක් වූවා පමණි. එහෙත්, ඉහත සඳහන් කළ විලියම් මැක්ගොවන්ගේ කෘතියේ විස්තර කෙරෙන තරුණ භික්ෂුව වැනි ඔවුන්ගේ අනුගාමිකයෝ, ඒ උද්වේගකාරී බොරුව ගෙඩිය පිටින් ගිල්ලෝය. එය, තවකෙකු ඝාතනය කිරීමට තරම් සහ තමාගේම ජීවිතය වුව නැති කර ගැනීමට තරම් වටිනා දෙයකැ යි විශ්වාස කළෝය. අවසානයේ, සාමාන්‍ය ඡන්ද පොරයක් විය යුතුව තිබූ ප්‍රථම පළාත් සභා මැතිවරණය කුඩා යුද්ධයක් බවට පත්කළෝය.

### අලූත් පළාත් සභා, එදා - අලූත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, අද

1988 දී පළමු පළාත් සභා මැතිවරණය පැවැත්වුණි. එය පැවැත්වුණේ අදියර හතරකිනි. එසේ කෙළේ, විශේෂ පහසුවක්

8 වන පිටට




